අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education,Higher Education and vocational Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර ( සාමාන්‍ය පෙළ ) විභාගය - 2025 (2026)

கல்விப் பொது தராதரப் பத்திர சாதாரண தரப் பரீட்சை -2025(2026)

General Certificate of Education (Ord. Level ) Examination -2025(2026)

# ඉතිහාසය

# History - வரலாறு

## අනුහුරු ප්‍රශ්න පත්‍රය
## பயிற்சி வினாத்தாள்
## Practice Paper



Question Paper – I ,II ප්‍රශ්න පත්‍රය- I,II (**සිංහල මාධ්‍යය**)

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**
**ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව**
கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education,Higher Education and vocational Education
National Languages and Humanities Branch

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education,Higher Education and vocational Education

| 33 | S | I |
|---|---|---|

ඉතිහාසය I
வரலாறு I
History I

අධ්‍යයන පොදු සහතික පත්‍ර ( සාමාන්‍ය පෙළ ) විභාගය - 2025 (2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை
General Certificate of Education ( Ord, Level ) Examination

පැය එකයි.
ஒரு மணித்தியாலம்
One Hours

**උපදෙස්**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **වඩාත් සුදුසු** පිළිතුර තෝරන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ ( X ) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. පහත සඳහන් කෘතීන් අතරින් දීපවංසය රචනා කිරීමට මූලාශ්‍රය කොට ගත් කෘතිය කුමක් ද?
(1) වංසත්ථප්පකාසිනීය (2) බෝධිවංශය (3) විනයට්ඨ කතාව (4) රාජාවලිය

2. ගල් පුවරු , ගල්තලා, ගල් ලෙන්, රන්පත් හා තඹ තහඩු වැනි මාධ්‍යයන් හි රචනා කර ඇති ලේඛන අයත් මූලාශ්‍රය වර්ගය කුමක් ද?
(1) පුවරු ලිපි (2) ගිරිලිපි (3) ලෙන් ලිපි (4) අභිලේඛන

3. ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් රට අභ්‍යන්තරයේ ජීවත් වූ මානවයින් කලපු බෙල්ලන් ආහාරයට ගනු ලැබුවේ,
(1) ප්‍රදේශයේ බහුලව ජීවත් වන නිසා ය. (2) ලුණු අවශ්‍යතාව ය සපුරා ගැනීම සඳහා ය.
(3) ශක්ති ජනක ආහාරයක් වන නිසා ය. (4) පහසුවෙන් ලබාගත හැකි නිසා ය.

4. සාරවත් රතු දුඹුරු පස පිහිටා ඇති දේශගුණික කලාපය කුමක් ද?
(1) පහතරට වියළි කලාපය (2) ශුෂ්ක කලාපය
(3) තෙත් කලාපය (4) කඳුකර වියළි අතරමැදි කලාපය

5. කුලය නම් සමාජ ඒකකයේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරන ලද්දේ කවුරුන් ද?
(1) ගෘහපති (2) කුලපති (3) ගමික (4) පරුමක

* A , B , C හා D යන ප්‍රකාශ ඇසුරෙන් පහත 6 හා 7 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  - A - පොදු කටයුතු වල දී ගම නියෝජනය කරමින් සහභාගී වීම
  - B - ගම් වැව් පද්ධතියක වැසියන්ගේ සුභසිද්ධිය වෙනුවෙන් තීරණ ගැනීම
  - C - තොටුපළවල අයබදු ලබා ගැනීම හා දේපළ භුක්ති විඳීම
  - D - ගෘහපතීන් අතරින් ම තේරී පත්වීම

6. සිතුල්පව්ව කොරවක්ගල ප්‍රදේශයෙන් හමු වූ සෙල්ලිපියේ සඳහන් පාලකයා සම්බන්ධ නිවැරදි තොරතුරු ඇතුළත් ප්‍රකාශය වන්නේ,
(1) A හා C ය. (2) A හා D ය. (3) B හා C ය. (4) C හා D ය.

7. දඹුල්ල, කණ්ඩලම කොත්ගල්කන්ද ප්‍රදේශයෙන් හමු වූ සෙල්ලිපියේ සඳහන් පාලකයා සම්බන්ධ නිවැරදි තොරතුරු ඇතුළත් ප්‍රකාශය වන්නේ,
(1) A හා C ය. (2) A හා D ය. (3) B හා C ය. (4) C හා D ය.

8. සමස්ත ලෝකයට ම අධිපති යන තේරුම ලබා දෙන රාජ්‍යත්ව සංකල්පයකි,
(1) දේවත්ව. (2) බෝධිසත්ව. (3) චක්‍රවර්තී. (4) පර්වතරාජ.

9. **I තීරුවේ** ලංකාව පාලනය කළ කීර්තිමත් පාලකයින් කිහිප දෙනෙකු දක්වා ඇති අතර **II තීරුවේ** එම රජවරුන්ගේ අනුප්‍රාප්තික පාලකයන් දක්වා ඇත. **I තීරුව** අනුව **II තීරුව** ගැළපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. දුටුගැමුණු<br>2. වසභ<br>3. ධාතුසේන | A – සද්ධාතිස්ස<br>B – කාශ්‍යප<br>C – කාවන්තිස්ස<br>D – වංකනාසිකතිස්ස |

(1) A,B,D (2) A,D,B (3) C,D,B (4) C,B,D

දෙවැනි පිටුව බලන්න

10. හතර වන උදය රජතුමාට අයත් සොරබොර වැව ටැම් ලිපියෙන් විස්තර කර ඇත්තේ,
(1) වෙළෙඳ පොළ පාලනය පිළිබඳ තොරතුරු ය. (2) කාල සුමන වෙළෙඳ පොළ පිළිබඳ තොරතුරු ය.
(3) වෙළෙඳ සමූහයන් පිළිබඳ තොරතුරු ය. (4) වෙළෙඳ පොළ බදු අය කිරීම පිළිබඳ තොරතුරු ය.

11. අතීත ශ්‍රී ලංකාවේ වෙළෙඳාම සඳහා ග්‍රීක් මැසිඩෝනියන් ප්‍රදේශයෙන් පැමිණි වෙළෙඳුන් හඳුන්වා ඇත්තේ කුමන නමකින් ද?
(1) දමෙඩ (2) අයෝනියන්වරු (3) ජාවකවරු (4) කාම්බෝජවරු

12. ඇළ මාර්ග වෙත වැවෙන් පිට කරනු ලබන ජල ප්‍රමාණය පාලනය කරනු ලබන්නේ ,
(1) පිටවාන මඟිනි. (2) සොරොව්ව මඟිනි. (3) බිසෝකොටුව මඟිනි. (4) මොහොළ මඟිනි.

13. අතීත ශ්‍රී ලාංකිකයන් විසින් දිග මැනීම සඳහා යොදා ගත් කුඩා ම ඒකකය කුමක් ද?
(1) ලාහ (2) වීහ (3) ගුන්ජා (4) පරමාණුව

14. බෙහෙත් ගුණ ඇති කොළ වර්ග යොදා සකසන ලද කැඳ වර්ග හඳුන්වා ඇත්තේ,
(1) යාගු නමිනි. (2) හම්බු නමිනි. (3) ඇඹුල්හඹු නමිනි. (4) උළුකැඳ නමිනි.

15. ක්‍රිස්තු වර්ෂ හයවන සියවසේ දී පමණ ඉන්දියන් සාගරයේ ක්‍රියාත්මක වූ අන්තර්ජාතික වෙළෙඳාම් කටයුතු වල අයිතිය ලබා ගත්තේ කවුරුන් ද?
(1) ඕලන්ද ජාතිකයින් (2) ඉංග්‍රීසි ජාතිකයින් (3) පෘතුගීසි ජාතිකයින් (4) අරාබි ජාතිකයින්

16. පොළොන්නරුව රාජධානිය බිඳවැටීම සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?
(1) දුර්වල පාලකයන් බලයට පත් වීම (2) රාජ වංශ අතර ඇති වූ බල අරගලය
(3) ආර්ථික පරිහානිය (4) චෝළ ආක්‍රමණ

17. පහත සඳහන් පාලකයන් අතරින් කැලණි විහාරය ප්‍රතිසංස්කරණය කරවන ලද පාලකයා කවුරුන් ද?
(1) තුන් වන විජයබාහු රජතුමා (2) දෙවන පරාක්‍රමබාහු රජතුමා
(3) හතර වන විජයබාහු රජතුමා (4) පළමු වන බුවනෙකබාහු රජතුමා

18. තුන් වන වික්‍රමබාහු රජුගේ ප්‍රධාන අමාත්‍ය වරයා වූයේ,
(1) දේව පතිරාජ ඇමතිවරයා ය. (2) සේනාලංකාධිකාර සෙනෙවිවරයා ය.
(3) වීර අලකේශ්වර ය. (4) නිශ්ශංක අලකේශ්වර ය.

19. **I තීරුවේ** ග්‍රන්ථ කිහිපයක නම් දක්වා ඇති අතර **II තීරුවේ** එම ග්‍රන්ථවල අන්තර්ගත තොරතුරු පිළිබඳ විස්තරයක් දක්වා ඇත. **I තීරුව** අනුව **II තීරුව** ගැළපූ විට නිවැරදි පිළිතුර තෝරන්න.

| **I තීරුව** | **II තීරුව** |
|---|---|
| 1. සිදත් සඟරාව<br>2. එළු සඳැස් ලකුණ<br>3. දඹදෙණි කතිකාවත | A – කාව්‍යකරණය පිළිබඳ නීති<br>B – භික්ෂු විනය<br>C – පැරකුම් රජුගේ දින චරියාව<br>D – සිංහල ව්‍යාකරණ |

(1) A,D,C (2) D,B,C (3) D,A,B (4) D,B,A

20. පුනරුද සමයේ දී සංගීතඥයෙක්, ප්‍රායෝගික ඉංජිනේරුවෙක් , ගෘහනිර්මාණ ශිල්පියෙක් හා දක්ෂ චිත්‍ර ශිල්පියෙකු ලෙස ප්‍රසිද්ධියට පත් ව සිටි පුද්ගලයා කවුරුන් ද?
(1) මයිකල් ආන්ජිලෝ (2) රෆායල් (3) ලියනාඩෝ ඩාවින්සි (4) මැසෙක්ෂියෝ

- යුරෝපා බිහි වූ ගෘහනිර්මාණවල ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ. එම තොරතුරු ඇසුරෙන් 21 හා 22 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - උල් කේතු ආකාර හැඩයේ ආරුක්කු
B - අර්ධ ගෝලාකාර ශිඛර
C - වටකුරු ආරක්කු
D - උස් වහළ
E - උස් කුලුනු
F – පිරමීඩ හැඩයේ කුලුනු

21. ඉහත තොරතුරු ඇසුරෙන් රෝම ගෘහ නිර්මාණ ශිල්පයේ ලක්ෂණ පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) ADහා E (2) BC හා E (3) BD හා E (4) CE හා F

22. ඉහත තොරතුරු ඇසුරෙන් මධ්‍යතන යුගයේ බිහි වූ ගෘහ නිර්මාණ වල ලක්ෂණ දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) AD හා F (2) AD හා E (3) BD හා E (4) CD හා F

23. ක්‍රි.ව 1505 වර්ෂයේ දී පෘතුගාල රජු විසින් පෙරදිග පෘතුගීසි ප්‍රතිරාජයා වශයෙන් පත් කරනු ලැබුවේ කවුරුන් ද?
(1) ෆ්‍රැන්සිස්කු ද අල්මේදා (2) වස්කෝද්ගාමා (3) ලොරෙන්සෝද අල්මේදා (4) ලසර්දා

24. පිලිප් ද ඔලිවේරා යටතේ සංවිධානය වූ පෘතුගීසි හමුදාවක් මගින් යටත් කරගනු ලැබුවේ,
(1) යාපනය රාජධානිය යි. (2) රයිගම රාජධානිය යි.
(3) කෝට්ටේ රාජධානිය යි. (4) මහනුවර රාජධානිය යි.

25. කුසුමාසන දේවිය උඩරට රැජින ලෙස නම් කිරීම, පෙරෝ ලෝපේස් ද සූසා ගේ මරණය සිදුවීම යන සිදුවීම් හා සම්බන්ධ උඩරට ප්‍රදේශයේ ඇතිවූ සටන හඳුන්වන නම කුමක් ද?
(1) මුල්ලේරියාව සටන (2) දන්තුරේ සටන (3) බලන සටන (4) ගන්නොරුව සටන

26. විලියම් හෝකින්ස් ඇතුළු නැව් කණ්ඩායම ඉන්දියාවට පැමිණෙන විට ඉන්දියාවේ පාලකයා ලෙස කටයුතු කරනු ලැබුවේ කවුරුන් ද?
(1) සාජාහාන් (2) මහා අක්බර් (3) ඖරන්සෙබ් (4) ජහන්ගීර්

27. කොළඹ, ගාල්ල, කල්පිටිය හා මහනුවර ආදී ප්‍රදේශවල ආගමික ප්‍රචාරක වැඩ කටයුතුවල නිරත වූ මිෂනාරී සංවිධානය කුමක් ද?
(1) චර්ච් (2) ලන්ඩන් (3) වෙස්ලියන් (4) ඇමරිකන්

28. අනුරාධපුරයේ පූජනීය ස්ථාන රැක ගැනීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලද්දේ,
(1) අනගාරික ධර්මපාල තුමා විසිනි. (2) ඕල්කොට් තුමා විසිනි.
(3) පියදාස සිරිසේන මහතා විසිනි. (4) වලිසිංහ හරිස්චන්ද්‍ර තුමා විසිනි.

29. අරුමුග නාවලර් තුමා විසින් ආරම්භ කරන ලද පාසල කුමක් ද?
(1) සහිරා විද්‍යාලය (2) ශිවන්ගල විද්‍යාලය (3) පරමේශ්වර විද්‍යාලය (4) රාමනාදන් විද්‍යාලය

30. ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය පාලනය නිසා මෙරටට උරුම වූ අයහපත් අංගයක් වන්නේ,
(1) ඉංග්‍රීසි දැනුම ව්‍යාප්ත වීම යි. (2) පාර්ලිමේන්තු පාලන ක්‍රමය යි.
(3) ස්වයංපෝෂිත අර්ථ ක්‍රමය බිඳ වැටීම යි. (4) අපනයන වැවිලි භෝග හඳුන්වා දීම යි.

- පහත A හා B ප්‍රකාශ ඇසුරෙන් 31 හා 32 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

A – ජනමත විචාරණය

B – ජනාධිපතිවරණය

31. මුලු ලංකාව ම එක ම ඡන්ද කොට්ඨාසයක් සේ සලකා පවත්වනු ලබන මැතිවරණ සම්බන්ධයෙන්,
(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

32. ජනතාව සතු ව්‍යවස්ථාදායක බලය සෘජු ව ම ක්‍රියාත්මක වන අවස්ථා සම්බන්ධයෙන්,
(1) A හා B සත්‍ය වේ. (2) A හා B අසත්‍ය වේ.
(3) A සත්‍ය වන අතර B අසත්‍ය වේ. (4) A අසත්‍ය වන අතර B සත්‍ය වේ.

33. ක්‍රි.ව.1972 ඉඩම් ප්‍රතිසංස්කරණ මඟින් එක් පුද්ගලයෙකු සතුව තබා ගත හැකි ඉඩම් ප්‍රමාණය සීමා කරන ලද්දේ,
(1) ඩඩ්ලි සේනානායක මහතා විසිනි. (2) ජෝන් කොතලාවල මහතා විසිනි.
(3) ජේ.ආර්. ජයවර්ධන මහතා විසිනි. (4) සිරිමා බණ්ඩාරනායක මහත්මිය විසිනි.

34. ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද පළමු අපනයන සැකසුම් කලාපය පිහිටි ප්‍රදේශය කුමක් ද?
(1) කටුනායක (2) ඒකල (3) බියගම (4) රත්මලාන

35. ශ්‍රී ලංකාවට නිදහස් අධ්‍යාපන ක්‍රමය හඳුන්වා දෙනු ලැබුවේ කිනම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය ක්‍රියාත්මක වූ අවධියක ද?
(1) කෝල්බෲක් (2) මැනිං (3) ඩොනමෝර් (4) සෝල්බරි

36. පළමු ලෝක සංග්‍රාමයෙන් අනතුරුව ඇබිසීනියාව ආක්‍රමණය කළ රට කුමක් ද?
(1) ජපානය (2) ඉතාලිය (3) ජර්මනිය (4) ප්‍රංශය

- පහත A, B,C හා D යටතේ ප්‍රකාශ යුගලය බැගින් දක්වා ඇත. මෙහි පළමු වැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාව පරීක්ෂා කර බලා 37 සිට 40 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – 1. ජර්මන් අධිරාජ්‍යයක් පිහිටුවීම
2. හමුදා ශක්තිය වැඩි කිරීම

B – 1. යුරෝපයේ පැවති ඒකාධිපති රාජාණ්ඩු බිඳවැටීම
2. පළමු ලෝක මහා සංග්‍රාමය

C - 1. නට්සිවාදය
2. යුදෙව්වන් හෙලා දැකීම

D – 1. මිසර ජනාධිපතිගේ සමාජවාදී ආර්ථික පිළිවෙත
2. සූවස් අර්බුදය

37. දෙවැන්න, පළමුවැන්නේ එක් ලක්ෂණයක් බව ප්‍රකාශ කෙරෙන යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

38. පළමුවැන්න, දෙවැන්නේ ප්‍රතිඵලයක් බව ප්‍රකාශ කෙරෙන යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

39. පළමුවැන්න සඳහා දෙවැන්න උපකාරී වූ බව ප්‍රකාශ කෙරෙන යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

40. පළමුවැන්න නිසා දෙවැන්න ඇති වූ බව ප්‍රකාශ කෙරෙන යුගලය කුමක් ද?

(1) A (2) B (3) C (4) D

****

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education,Higher Education and vocational Education

| 33 | S | II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර ( සාමාන්‍ය පෙළ ) විභාගය - 2025 (2026)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை
General Certificate of Education ( Ord. Level ) Examination

ඉතිහාසය II
வரலாறு II
History II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

* I කොටසේ ප්‍රශ්න අංක 1 අනිවාර්ය වේ.
* II කොටසින් ප්‍රශ්න **හතරකට** ද, III කොටසින් ප්‍රශ්න **එකකට** ද පිළිතුරු සපයන්න.
* පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **හයකි.**

## I කොටස

1. (අ) (i) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ලකුණු කර නම් කරන්න.
පල්ලවංක , කන්තලේ වැව , සොරබොර වැව, මාදුරුඔය , නිල්වලා ගඟ, කෝට්ටේ ,බුන්දල
කන්තරෝඩය, මිහින්තලය , මාතලේ , ලුණුවිල , පොල්ගොල්ල අමුණ (ලකුණු12යි)

(ii) පහත දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ලකුණු කර නම් කරන්න.
ග්‍රීසිය, පර්සියන් බොක්ක , පිලිපීන දූපත්, කොරියන් අර්ධද්වීපය , බොම්බාය , ෆ්ලෝරන්ස්
(ලකුණු 06යි)

(ආ) (i) පහත *A, B, C* හා *D* යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.
A - ගල්පොත සෙල්ලිපිය ලියවන ලද රජතුමා කවුරුන් ද?
B - ලංකාව පිළිබඳ තොරතුරු ඇතුළත් කරමින් අජායිබ් අල් හින්ද් නම් කෘතිය රචනා කරන ලද්දේ කවුරුන් ද?
C - ජෝර්ජ් වෝල් ගේ නායකත්වයෙන් ක්‍රි.ව 1865 වසරේ පිහිටුවා ගන්නා ලද සංගමය කුමක් ද?
D - ගල්ෆ් අර්බුදය සමයේ දී ඉරාකය විසින් ආක්‍රමණය කරන ලද රට කුමක් ද? (ලකුණු 04 යි)

* *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

(ii) 1. *A* රූපයෙන් දැක්වෙන ප්‍රතිමාවෙන් නිරූපණය වන පාලකයා කවුරුන් ද?
2. එතුමා ගේ පාලන සමයේ ලංකාවේ අගනගරය කුමක් ද?
3. එතුමා වීදුරු පබළු ගෙන්වාගත් රට කුමක් ද?
4. මෙම ප්‍රතිමාව දැක ගතහැක්කේ කිනම් දාගැබ අසලින් ද?

(ලකුණු 04 යි)



*A*



B

(iii) 1. *B* රූපයෙන් දැක්වෙන පුද්ගලයා කවුරුන් ද?

2. ඔහු විසින් ගොඩනගන ලද රාජ්‍යය කුමක් ද?

3. එම රාජ්‍යය ගොඩනැගීමේ දී සතුරන් බවට පත් රාජ්‍යය කුමක් ද?

4. ඔහු ගොඩනගන ලද රාජ්‍යය අධිරාජ්‍යක් දක්වා ගොඩනැගීමට උත්සහ ගත් පාලකයා කවුරුන් ද?

(ලකුණු 04 යි)

## II කොටස

2. (i) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ ඉරණමඩු සැකැස්මට අයත් ප්‍රදේශවල පිහිටි මානව වාසස්ථාන **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයා අවමංගල අභිචාර විධියක් ලෙස ඇටසැකිලි මත ගුරු ගල් ආලේප කිරීම පිළිබඳ සාධක හමුවන ස්ථාන **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ පැවති සුසාන ක්‍රම වල දැකිය හැකි පොදු ලක්ෂණ **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ව්‍යුහය හා ස්වරූපය එහි දක්නට ඇති ලක්ෂණ **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

3. (i) පූර්ව රාජ්‍ය සමයේ දී පාලන කටයුතු හා සම්බන්ධ වූ ප්‍රධානීන් **තිදෙනෙකු** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර පාලනය විධිමත් කිරීම සඳහා වසභ රජු ගත් ක්‍රියාමාර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) අතීත ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ රාජ්‍ය උරුම සම්ප්‍රදායන් **දෙකක්** උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) අතීත ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතු සිදු වූ ආකාර **තුන** උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

4 . (i) ඓතිහාසික යුගයේ මෙරට භාවිත කළ විදේශීය කාසි වර්ග **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**A** - රජුට සමීප ව කටයුතු කළ රාජකීය නිලධාරීන් අතීතයේ හැඳින්වූ නම

B - පාරම්පරික ව දාසයන් ලෙස කටයුතු කළ සමාජ කණ්ඩායම හැඳින්වූ නම

C - පළමු විජයබාහු රජුට කුඩා අවධියේ රැකවරණය ලබා දුන් රාජකීය නිලධාරියා

D - පැරණි සෙල්ලිපිවල **මාත්‍රික** නමින් හඳුන්වා ඇත්තේ (ලකුණු 04 යි)

(iii) සමාජ සංවිධානයක දැකිය හැකි පුද්ගල සබඳතාවයන්හි ස්වරූප **දෙක** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) අතීත කාන්තාව සමාජය තුළ ගෞරවාදරයට පත්වීමට බලපෑ හේතු **තුනක්** උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

5. (i) මහනුවර රාජධානියට සමකාලීන ව ලංකාවේ පැවති වෙනත් රාජධානි **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) මහනුවර රාජධානි සමයේ රජතුමා විසින් ම විසඳන ලද නඩු වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) රාජ්‍යත්වයට පත්වීමේ දී පළමු වන විමලධර්මසූරිය රජු මුහුණ දුන් අභියෝග **දෙකක්** ජය ගත් ආකාරය විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) මහනුවර යුගයේ පරිපාලන කටයුතු හා සම්බන්ධව පැවති ප්‍රධාන අංශ **තුනක්** දක්වා එවා හි කාර්යය භාරය විස්තර කරන්න. (ලකුණු 06 යි)

6. (i) මදුරාසි පාලනය යටතේ ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනයට පත් කළ නිලධාරීන් **තිදෙනෙකු** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ හේතු **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) ක්‍රි.ව 1797/98 කාල වකවානුවේ දී ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශයේ ඇති වූ බ්‍රිතාන්‍ය විරෝධී අරගලයට විසඳුම් සෙවීමට පත් කළ මියුරන් කොමිසමේ නිර්දේශ දෙකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) ක්‍රි.ව.1848 දෙවන නිදහස් සටන අසාර්ථක වීමට බලපෑ හේතු **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

7. (i) කෝල්බෲක් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය හඳුන්වා දීමෙන් අනතුරුව නව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් ඉල්ලා යටත්විජිත භාර ලේකම් වෙත පෙත්සම් ඉදිරිපත් කළ ශ්‍රී ලාංකික සංවිධාන **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ක්‍රි.ව.1833 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන් හඳුන්වා දුන් විධායක සභාවට යෝජනා කළ නිලධාරීන් **හතර දෙනෙක්** නම් කරන්න (ලකුණු 04 යි)

(iii) ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ කැපී පෙනෙන ලක්ෂණ **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) ශ්‍රී ලංකාවේ පළමු ජනරජ ව්‍යවස්ථාවේ කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

## III කොටස

8. (i) බ්‍රිතාන්‍යයේ ගල් අඟුරු බහුලව ඇති ප්‍රදේශ **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) කාර්මික විප්ලවය අවධියේ බ්‍රිතාන්‍යයේ පේෂ කර්මාන්තය දියුණු වීමට බලපෑ හේතු **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) කාර්මික විප්ලවයේ බලපෑමෙන් ලෝක දේශපාලනයේ සිදු වූ වෙනස්කම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) කාර්මික විප්ලවයේ බලපෑමෙන් ශ්‍රී ලංකාවේ සිදු වූ වෙනස්කම් **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

9. (i) ඇමරිකන් නිදහස් සටන අවධියේ බ්‍රිතාන්‍ය අගමැති ජෝර්ජ් ග්‍රෙන්විල් විසින් ආදායම වැඩි කර ගැනීම සඳහා පනවන ලද නව බදු පනත් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත $A$ සිට $D$ දක්වා ප්‍රශ්නවලට පිළිතුරු වරහන තුළින් තෝරා ලියන්න.

A - ඇමරිකානු විප්ලව ඉතිහාසයේ ප්‍රථම මහද්වීපික සම්මේලනය පැවැත් වූ නගරය
B - ප්‍රංශයේ ප්‍රාදේශීය පාලනය විධිමත් කිරීම සඳහා ප්‍රංශ රජු විසින් පත් කරන ලද නිලධාරීන්
C - නීතියේ සාරය නම් කෘතියේ කතුවරයා
D - රුසියාවේ සාර් පාලනය බිඳ දමා බලයට පත් සටන්කාමී නායකයා (ලකුණු 04 යි)

( රූසෝ , පැරිස් , පිලඩෙල්පියා , නැපෝලියන් බොනපාට් , ඉන්ටෙන්ඩාන්ට් , ස්ටේට් ජනරල්, කෙරෙන්ස්කි )

(iii) ප්‍රංශ විප්ලවය ඇතිවීමට බලපෑ ආර්ථික හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) රුසියන් විප්ලවයේ ප්‍රතිඵල **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

*****

අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education,Higher Education and vocational Education


33 | STE | II

අධ්‍යයන පොදු සහතික පත්‍ර ( සාමාන්‍ය පෙළ ) විභාගය - 2025 (2026)
**கல்விப் பொது தராதரப் பத்திர சாதாரண தரப் பரீட்சை -2025(2026)**
**General Certificate of Education (Ord. Level ) Examination -2025(2026)**


**ඉතිහාසය II**
வரலாறு II
History II

1 . (අ ) (i)
1 . ( அ) (i)
1 . (a ) (i)

විභාග අංකය
சுட்டெண்
Index No ..............................



1 . (අ ) (ii)
1 . ( அ) (ii)
1 . (a ) (ii)



අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education,Higher Education and vocational Education

**අධ්‍යයන පොදු සහතික පත්‍ර ( සාමාන්‍ය පෙළ ) විභාගය -2025 (2026)**
**கல்விப் பொது தராதரப் பத்திர சாதாரண தரப் பரீட்சை -2025(2026)**
General Certificate of Education (Ord. Level ) Examination -2025(2026)

# ඉතිහාසය
# History - வரலாறு

## අනුහුරු ප්‍රශ්න පත්‍රය සඳහා පිළිතුරු පත්‍රය
**பயிற்சி வினாத்தாளுக்கான விடைப்பத்திரம**
## Answer sheet for the Practice Paper



## Answer Paper – I ,II පිළිතුරු පත්‍රය - I,II (සිංහල මාධ්‍යය)

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**
**ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව**
கல்வி உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சு
Ministry of Education,Higher Education and vocational Education
National Languages and Humanities Branch

# අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
## ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව
## අ.පො.ස. (සා.පෙළ) විභාගය 2025(2026)
## 33 ඉතිහාසය - අනුහුරු ප්‍රශ්න පත්‍රය

**II පත්‍රය -**

**I කොටස**

**ප්‍රශ්න අංක 1 (අනිවාර්ය ප්‍රශ්නයකි.)**

**(අ) කොටස - ලකුණු 18**
**(ආ) කොටස - ලකුණු 12**
} **ලකුණු 30**

**II කොටස**

**ප්‍රශ්න අංක 2 - ලකුණු 18**
**ප්‍රශ්න අංක 3 - ලකුණු 18**
**ප්‍රශ්න අංක 4 - ලකුණු 18**
**ප්‍රශ්න අංක 5 - ලකුණු 18**
**ප්‍රශ්න අංක 6 - ලකුණු 18**
**ප්‍රශ්න අංක 7 - ලකුණු 18**
} **(ඕනෑම ප්‍රශ්න 4 කට)**
**4 × ලකුණු 18 = ලකුණු 72**

**III කොටස**

**ප්‍රශ්න අංක 8 - ලකුණු 18**
**ප්‍රශ්න අංක 9 - ලකුණු 18**
} **(ඕනෑම ප්‍රශ්න 1 කට)**
**1 x 18 ලකුණු =18**


} **ලකුණු 120**

# I පත්‍රය - පිළිතුරු


| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|---|---|---|---|
| 01 | 3 | 11 | 2 | 21 | 2 | 31 | 1 |
| 02 | 4 | 12 | 4 | 22 | 1 | 32 | 3 |
| 03 | 2 | 13 | 4 | 23 | 1 | 33 | 4 |
| 04 | 1 | 14 | 3 | 24 | 1 | 34 | 1 |
| 05 | 1 | 15 | 4 | 25 | 2 | 35 | 3 |
| 06 | 2 | 16 | 4 | 26 | 4 | 36 | 2 |
| 07 | 3 | 17 | 1 | 27 | 1 | 37 | 3 |
| 08 | 3 | 18 | 4 | 28 | 4 | 38 | 2 |
| 09 | 2 | 19 | 3 | 29 | 2 | 39 | 1 |
| 10 | 1 | 20 | 3 | 30 | 3 | 40 | 4 |

# II කොටස

1. (අ) (i)



1. (අ) (ii)




(ආ) (i) පහත *A, B, C* හා *D* යටතේ දක්වා ඇති ප්‍රශ්නවලට අදාළ පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

A - ගල්පොත සෙල්ලිපිය ලියවන ලද රජතුමා කවුරුන් ද?

B - ලංකාව පිළිබඳ තොරතුරු ඇතුළත් කරමින් අජායිබ් අල් හින්ද් නම් කෘතිය රචනා කරන ලද්දේ කවුරුන් ද?

C - ජෝර්ජ් වෝල් ගේ නායකත්වයෙන් ක්‍රි.ව 1865 වසරේ පිහිටුවා ගන්නා ලද සංගමය කුමක් ද?

D - ගල්ෆ් අර්බුදය සමයේ දී ඉරාකය විසින් ආක්‍රමණය කරන ලද රට කුමක් ද? (ලකුණු 04 යි)

(ආ) ( i ).

A. කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල රජු/නිශ්ශංකමල්ල රජු

B. ඉබන් ශහ්රියර්

C. ලංකා සංගමය

D. කුවේටය

(ii) 1. *A* රූපයෙන් දැක්වෙන ප්‍රතිමාවෙන් නිරූපණය වන පාලකයා කවුරුන් ද?

2. එතුමා ගේ පාලන සමයේ ලංකාවේ අගනගරය කුමක් ද?

3. එතුමා වීදුරු පබළු ගෙන්වාගත් රට කුමක් ද?

4. මෙම ප්‍රතිමාව දැක ගතහැක්කේ කිනම් දාගැබ අසලින් ද?

(ලකුණු 04 යි)



*A*

(ii).

A.

1.භාතිකාභය රජු

2.අනුරාධපුරය

3.රෝමානුක දේශය/රෝමය

4.රුවන්වැලි සෑය

(iii) 1. *B* රූපයෙන් දැක්වෙන පුද්ගලයා කවුරුන් ද?

2. ඔහු විසින් ගොඩනගන ලද රාජ්‍යය කුමක් ද?

3. එම රාජ්‍යය ගොඩනැගීමේ දී සතුරන් බවට පත් රාජ්‍යය කුමක් ද?

4. ඔහු ගොඩනගන ලද රාජ්‍යය අධිරාජ්‍යක් දක්වා ගොඩනැගීමට උත්සහ ගත් පාලකයා කවුරුන් ද?

(ලකුණු 04 යි)



*B*

(iii).

B.

1. ඔටෝවොන් බිස්මාර්ක්/බිස්මාර්ක්

2. ජර්මනිය

3. ප්‍රංශය

4. දෙවන විලියම් රජු/දෙවන විලියම් කයිසර්

# II කොටස

## ප්‍රශ්න අංකය 02

2. (i) ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූ ඉරණමඩු සැකැස්මට අයත් ප්‍රදේශවල පිහිටි මානව වාසස්ථාන **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)
   (ii) ප්‍රාග් ඓතිහාසික මානවයා අවමංගල අභිචාර විධියක් ලෙස ඇටසැකිලි මත ගුරු ගල් ආලේප කිරීම පිළිබඳ සාධක හමුවන ස්ථාන **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)
   (iii) පූර්ව ඓතිහාසික යුගයේ පැවති සුසාන ක්‍රමවල දැකිය හැකි පොදු ලක්ෂණ **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)
   (iv) මුල් ඓතිහාසික යුගයේ ජනාවාසවල ව්‍යුහය හා ස්වරූපය එහි දක්නට ඇති ලක්ෂණ **තුනක්** ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

02.( i ). බුන්දල,මිනිහාගල්කන්ද,පතිරාජවෙල,අලුගල්ගේ,උඩමළල,මාතොට,ඉරණමඩු (ලකුණු 1x3 =03 යි)

( ii ). රාවණාඇල්ල ලෙන,පාහියන්ගල ලෙන (ලකුණු 2x2 =04 යි)

( iii). 1. **විධිමත් සුසාන ක්‍රම ඇරඹීම**

- ශිලා මංජුසා ක්‍රමය
  උදා- ඉබ්බන්කටුව ,යටිගල්පොත්ත,යාපහුව ගල්සොහොන් කනත්ත
- මැටි ඔරු සුසාන ක්‍රමය
  උදා -බෙරගල,හල්දුම්මුල්ල,රංචමඩම පාසල් භූමිය
- හරණී සුසාන
  විශාල මැටි බඳුනක් පොළොව තුළ තැන්පත් කොට ඒ තුළ භෂ්මාවශේෂ පිර වූ කුඩා මැටි බඳුන් තැන්පත් කිරීම
  උදා-පොම්පරිප්පු

2. **මිනිස් ඇටසැකිලි ආදාහනය කිරීම**
- මැටි සුසාන තුළ දහනය කොට තිබීම
- මිනිස් ඇටසැකිලි පිටත දහනය කොට එම භෂ්මාවශේෂ ශිලා මංජුසා හා හරණී සුසාන වල තැන්පත් කිරීම.

3. **භෂ්වාශේෂ සමග ඔවුන් භාවිත කළ දෑ තැන්පත් කිරීම**
   උදා- මැටි බඳුන්,ඉබන්කටුව පබළු මාලය,පබළු,ලෝහ වළලු,යබොර, ආදිය (ලකුණු 2+3 =05 යි)

( iv ).1. <u>**කුඩා ගම් වැවක් කේන්ද්‍ර කරගෙන ගමක් පිහිටා තිබීම**</u>

- මෙම යුගයේ වැවක් කේන්ද්‍රකොටගෙන බිහි වූ ජනාවාස වාපිගාම යනුවෙන් සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් වේ. මහාවංසයේ වාපිගාම රාශියක නම් සඳහන් වේ.

  සුමනවාපීගාම ,විහාර වාපීගාම,හුන්දරීවාපී ගාම වශයෙනි.

2. <u>**වෘත්තිකයන් විසූ ගම්මාන පැවතීම**</u>

- කසීකාර ගාම,මණිකාරගාම,කේවට්ටගාම,කුම්භකාරගාම,වඩ්ඪකී ගාම

3. <u>**කාර්යයන් පදනම් කරගත් ගම්මාන පැවතීම**</u>

   පට්ඨාන ගාම- වරාය ආශ්‍රිත ගම් -නියම් ගම් -වෙළෙඳ ගම්

**4. <u>නිවාසවල ස්වරූපය හා මනා පරිපාලනය</u>**

- අනුරාධපුරයේ කරන ලද කැනීම්වලින් පැරණි ග්‍රාමීය නිවාස කිහිපයකට අයත්ව තිබූ අත්තිවාරම් හමුව තිබේ.ඒවා වරිච්චි බිත්තිවලින් හා කොලඅතු පියස්සකින් තැනුන පැල්පත්ය.ඒවා අතරින් සමහර ඒවා වටකුරුය.
- ජනාවාසවල විධිමත් පරිපාලන රටාවක්ද ක්‍රියාත්මක වී ඇත.පවුලක ප්‍රධානියා ගෘහපති විය.
- ගමක නායකයා ගමික විය.පසුකාලයේදී මෙකී ගම් ප්‍රධානීන් දසදෙනෙකුගෙන් සමන්විත වූ මණ්ඩලයක් මගින් ගම් කිහිපයකින් සැදුම්ලත් ප්‍රදේශයක පරිපාලනයට සම්බන්ධ ගැටලු විසඳා ඇත. මොවුන් හඳුන්වා ඇත්තේ දසගම් ඇත්තන් යනුවෙනි.
  උදා - කළුදියපොකුණ විහාරයේ සෙල්ලිපියක සඳහන් කර තිබෙන්නේ එම විහාරයේ දානය සම්බන්ධ ගැටළුවක් මතුවුවහොත් දසගම් ඇත්තන් රැස්වී එම ගැටළුව විසඳිය යුතු බවයි.

**<u>5. ගම්මාන එකිනෙකින් ස්වාධීනව පැවතීම</u>**

- පටු කැලෑවකින් ගම් වෙන්ව පැවතීම
- වැටකින් ආරක්ෂිතව පැවතීම -පරික්ඛිත්ත ගාම

**6. ගංඟා නිම්නයට ඇතින් පිහිටා තිබීම**

- ගංවතුර පාලනයට දැනුමක් නොතිබීම

**<u>7. ජන සංඛ්‍යාව අනුව ජනාවාස වර්ගීකරණයක් පැවතීම</u>**

ගම - කුඩා පවුල් ප්‍රමාණයක් සිටි ජනාවාස
පුර - ජනගහනය වැඩි ගම්මාන පුර ලෙස හැඳින්වීම මහා විජයබාහු රජුගේ පණාකඩුව තඹ සන්නසේ අනුරාධපුරය නුරුපුර ලෙස හඳුන්වා තිබීම
නකර/නගර - ගමත් නගරයත් අතර පැවති ගම්. (ලකුණු 3+3 =06 යි)

# ප්‍රශ්න අංකය 03

3. (i) පූර්ව රාජ්‍ය සමයේ දී පාලන කටයුතු හා සම්බන්ධ වූ ප්‍රධානීන් **තිදෙනෙකු** නම් කරන්න. (ලකුණු 03 යි)
(ii) ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර පාලනය විධිමත් කිරීම සඳහා වසභ රජු ගත් ක්‍රියාමාර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)
(iii) අතීත ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වූ රාජ්‍ය උරුම සම්ප්‍රදායන් **දෙකක්** උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05 යි)
(iv) අතීත ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතු සිදු වූ ආකාර **තුන** උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

03. ( i ). ගෘහපති,ගමික,දසගම් ඇත්තන්,පරුමක (ලකුණු 1x3 =03 යි)

(ii).

- රට පාලනයට ප්‍රාදේශීය නිළධාරින් පත් කිරීම
  උදා-යාපනයේ ප්‍රාදේශීය පාලකයා ලෙස සෘෂිගිරි ඇමති පත් කිරීම
- රට ආස්ථාන හෙවත් දිස්ත්‍රික්කවලට බෙදීම
- බදු එකතු කිරීම විධිමත් කිරීම (ලකුණු 2x2 =04 යි)

(iii).

**1. පියාගෙන් පුතාට**

උදා - පණ්ඩුකාභය රජුගෙන් පසු මුඨසිව - කාවන්තිස්ස රජුගෙන් දුටුගැමුණු
- වසභ රජුගෙන් පසු වංකනාසිකතිස්ස

**2. සහෝදරයාගෙන් සහෝදරයාට**

උදා - දුටුගැමුණු රජුගෙන් පසු සද්ධාතිස්ස

- දේවානම්පියතිස්ස රජුගෙන් පසු උත්තිය,මහාසිව,සූරතිස්ස,අසේල ආදී සහෝරදයන් රජ වීම

**3. මව් උරුමය අනුව රජකම හිමි වීම**

- රජුට පසුව රජුගේ සහෝදරියගේ පුතාට
  උදා -ගම්පල පස්වන පරාක්‍රමබාහු රජුගේ සහෝදරියගේ පුතා තුන්වන වික්‍රමබාහු ලෙස රජ වීම
- රජුගේ දියණියගේ පුතාට රාජ්‍ය උරුම වීම
  උදා- කෝට්ටේ හත්වන බුවනෙකබාහු රජුගේ දියණියගේ පුතා වූ ධර්මපාලට රජකම හිමි වීම
- **රජුගේ බිසවගේ සහෝදරයාට රජකම හිමි වීම**
  උදා- මහනුවර යුගයේ නායක්කර් පෙළපත (ලකුණු 2+3 =05) යි

(iv). 1. **හේන් වගාව**

- සෙල්ලිපිවල පිටිබිම් ලෙසත්, උම්මග්ග ජාතකයේ සේන් ලෙසත් ,බුත්සරණ කෘතියේ සෙහෙන් ලෙසත් හැඳින්වීම
- අලුතින් ගිනිතබා සකස් කළ හේන නවදැලි හේන ලෙස හැඳීන්වීම
- බෝගවර්ග නවයක් අලුතෙන් සිටුවා දළුලා වැඩෙන නිසා නවදැලි හේන ලෙස හඳුන්වා ඇති බව
- හේන්වල වගාකළ බෝග වර්ග (අලවර්ග ,ධාන්‍ය වර්ග ,එළවළු වර්ග,ඇල් වී වර්ග-රත් ඇල්,බිබිලි ඇල් )
- හේන්වලින් බදු අයකිරීම (කැති අඩ,කෙටු කනබ)

2. **මඩ ගොවිතැන**

- කුඹුරු ගොවිතැන
- වී වගා කල කාල කන්න ලෙස හැඳින්වීම (යල කන්නය,මහ කන්නය)
- කිත්සිරිමෙවන් රජුගේ තෝනිගල සෙල්ලිපියේ පිටදඩහස,මදහස,අකලහස (යල,මැද,මහ) ලෙස කන්න තුනක් සඳහන් වීම.
- අත්තම් ක්‍රමය භාවිතා කිරීම
- විවිධ වී වර්ග වගා කිරීම

3. **සත්ව පාලනය**

- ගව පාලනයේ යෙදුණු පිරිස් සඳහාම වෙන් වූ ගම් ගෝපාලගාම ලෙස හැඳින්වීම.
  උදා- හතරවන කාශ්‍යප රජුගේ සෙල්ලිපියක කිරිගෙරි යන පදය දක්නට තිබේ.ඉන් අදහස් කරන්නේ කිරි ලබා ගැනීම සඳහා ඇති කළ සතුන්ය.
- ගවයන් හැරුණු විට කුකුළන් හා එළුවන් නිවෙස්වල ඇති කර ඇත.
- සීගිරිය නාග පබ්බත විහාරයේ මහාමේරු ගලක එළදෙනකගෙන් කිරිදොවන කාන්තාවකගේ රූපයක් කැටයම් කර තිබීම

# ප්‍රශ්න අංකය 04

4 . (i) ඓතිහාසික යුගයේ මෙරට භාවිත කළ විදේශීය කාසි වර්ග **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**A** - රජුට සමීප ව කටයුතු කළ රාජකීය නිලධාරීන් අතීතයේ හැඳින්වූ නම

B - පාරම්පරික ව දාසයන් ලෙස කටයුතු කළ සමාජ කණ්ඩායම හැඳින්වූ නම

C - පළමු විජයබාහු රජුට කුඩා අවධියේ රැකවරණය ලබා දුන් රාජකීය නිලධාරියා

D - පැරණි සෙල්ලිපිවල **මාතෘක** නමින් හඳුන්වා ඇත්තේ (ලකුණු 04 යි)

(iii) සමාජ සංවිධානයක දැකිය හැකි පුද්ගල සබඳතාවයන්හි ස්වරූප **දෙක** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) අතීත කාන්තාව සමාජය තුළ ගෞරවාදරයට පත්වීමට බලපෑ හේතු **තුනක්** උදාහරණ ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

4 (i). රෝම,චීන,අරාබි,ඉන්දියන් (ලකුණු 1x3 =03 යි)

(ii). A - රදළ /රද්කොල් සම්දරු
B - අන්වායාතදාස
C- බුද්ධරාජ / සිත්නාරුබිම බුදල්නා
D- කුඩා ඇළමාර්ග/ ඇළමාර්ග (ලකුණු 1x 4 =04 යි)

(Iii).

**1. සිරස් ධූරාවලිය**

- සමාජ සංවිධානයක් තුළ පවතින ප්‍රධාන ලක්ෂණයක් වන්නේ පුද්ගල සම්බන්ධතාවලට අනුපිළිවෙලක් තිබීමයි.එය හැඳින්වෙන්නේ **ධූරාවලිය** ලෙසයි.
- ඉහළ සිට පහළට බලය ගලා යන ධූරාවලිය සිරස් ධූරාවලිය ලෙස හඳුන්වයි.

රජු
↓
ඇමතිවරු
↓
වෙනත් රජයේ නිලධාරීන්

**2. තිරස් ධූරාවලිය**

- එක සමාන මට්ටක ලා සැලකෙන නිලධාරින් සිටීම තිරස් ධූරාවලිය ලෙස හැඳින් වේ.
( සමාන්තර බලයෙන් යුත් ව්‍යුහ)
ඇමතිවරු —— සේනාපතිවරු —— භාණ්ඩාගාරිකවරු

(ලකුණු 2+3 =05) යි)

(iv).

**1. කාන්තා රැජිනියන් හා පරුමකවරියන් සිටීම ( දේශපාලන බලය හිමි වීම)**

- රාජ්‍ය පාලනය සඳහා පවා කාන්තාවන් සම්බන්ධවීමෙන් පැහැදිලි වන්නේ පැරණි සමාජයේ කාන්තාවගේ ගෞරවනීය බව පිළිබඳවයි.
- චූල සීවලී දේවී නම් මහ රැජිනක් පිළිබඳව නිල්ගිරි සෑය නම් ස්ථානයෙන් සොයාගත් සෙල්ලිපියක සඳහන් වේ.
- අනුරාධපුර යුගයේදී අනුලා රැජින හා චූල සීවලී රැජින ලංකාවේ රාජ්‍ය පාලනය මෙහෙයවා ඇත.
- පොළොන්නරු යුගයේදී ලීලාවතී රැජින තෙවතාවක් බලයට පත් වී ඇත.කළ්‍යාණවතී රැජින ද, පොළොන්නරු යුගයේ රජකම් කොට ඇත.
- රුහුණු දේශයේ සිටි සුගලා රැජින දිවයිනේ අගරැජිනක් නොවුනත් රුහුණේ ප්‍රබල ප්‍රාදේශීය රැජිනකි.
- පූර්ව ඓතිහාසික යුගයේදී මෙරට පාලනය කළ නායකයන් වූයේ පරුමකයන්ය. එම යුගයේදී ලංකාවේ පරුමකවරියන් සිට ඇත.ඔවුන් හඳුන්වා ඇත්තේ පරුමකලු ලෙසයි.අනුරාධපුර සෙල්ලිපියක **පරුමකලු සමනා** නැමැත්තියක් පිළිබඳව සඳහන් වේ.

**2. මාතෘත්වය ලැබීම**

- කාන්තාවන් විශේෂ ගෞරවයට පාත්‍ර වූයේ මවුවරුන් ලෙසයි.වරක් භික්ෂූන් වහන්සේලා විහාරමහාදේවිය අමතා ප්‍රකාශ කළේ ඔබ පෙර පින් කළ නිසා මහත් යස ඉසුරු හා සැප සම්පත් ලබා සිටින බවයි.ඊට පිළිතුරු දුන් විහාරමහා දේවිය ,දූවරු හා පුතුන් නැති ජීවිතය කුමන සැපක්දැයි භික්ෂූන් වහන්සේලා පෙරළා ප්‍රශ්න කළ බව රසවාහිනියේ දැක්වා තිබීම.

3. ආහාර පිසීමට දැක් වූ දක්ෂතාවය

- දෙමාපියන් විසින් සිය දියණිය සූප ශාස්ත්‍රයෙහි නිපුන කරවීම ඔවුන් සතු වගකීමක් බව සහස්සවත්ථුප්පකරණය නම් මූලාශ්‍රයේ සඳහන් වේ.සාලිය කුමරුගේ බිරිඳ වූ අශෝකමාලා දුටුගැමුණු රජුගේ මාලිගයේදී රසවත් ලෙස ආහාර පිළියෙළකොට කාගේත් සිත් දිනාගත් බව සද්ධර්මාලංකාරයේ සඳහන් වේ.
- සූප ශාස්ත්‍රයෙහි දක්ෂ කාන්තාවන් හැඳින්වූයේ මධුපාචිකා නමින් බව ධම්පියා අටුවාගැටපදයේ දැක්වේ. ඇතැම් අවස්ථාවල මධුරහත්තරසා යන නම ද යොදා තිබේ. එහි තේරුම මිහිරි අත්ගුණයක් ඇත්තී යන්නයි.

**4. පවුල සතු ධනය යහපත් කාර්යයන් සඳහා වියදම් කිරීමට අයිතියක් තිබීම ( දේපළවල හිමිකමක් පැවතීම)**

- පැරණි කාන්තාවන් ආගමික කටයුතු ආදිය නිදහසේ සිදුකොට ඇත.බෞද්ධ භික්ෂූන් වහන්සේලා උදෙසා,ගල්ලෙන් පූජා කිරීමට පෙරමුණ ගත් උපාසිකාවන්ගේ නම් එසේ පූජා කරන ලද ගල්ලෙන්වල කොටා තිබේ.අනුරාධපුර දිස්ත්‍රික්කයේ සෙල්ලිපියක තලතා ලක්ෂ්මී නම් කාන්තාවක් ගැන සඳහන්ය.
- භාතියතිස්ස රජුගේ කාලයේදී ඇය තමන්ගේ පවුල සතු දේපලවලින් කොටසක් බෞද්ධ විහාරයකට පූජා කළ බව සඳහන්ය.තමන් සතු ධනය වියදම් කොට ශාසනික කටයුතු කරගෙන යාමට එකල විසූ කාන්තාවන්ට නිදහසක් තිබුණි.

(ලකුණු 3+3 =06 යි)

# ප්‍රශ්න අංකය 05

5.(i) මහනුවර රාජධානියට සමකාලීන ව ලංකාවේ පැවති වෙනත් රාජධානි **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) මහනුවර රාජධානි සමයේ රජතුමා විසින් ම විසඳන ලද නඩු වර්ග **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) රාජ්‍යත්වයට පත්වීමේ දී පළමු වන විමලධර්මසූරිය රජු මුහුණ දුන් අභියෝග **දෙකක්** ජය ගත් ආකාරය විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) මහනුවර යුගයේ පරිපාලන කටයුතු හා සම්බන්ධව පැවති ප්‍රධාන අංශ **තුනක්** දක්වා එවා හි කාර්යය භාරය විස්තර කරන්න. (ලකුණු 06 යි)

05. (i). කෝට්ටේ ,යාපනය ,සීතාවක ,රයිගම (ලකුණු 1x3 =03 යි)

(ii). වැදගත් නායකයන් සම්බන්ද නඩු
කැරළි කෝලාහල පිළිබඳ නඩු
රාජද්‍රෝහිත්වය පිළිබඳ නඩු
කුමන්ත්‍රණ නඩු
විහාර හා භික්ෂූන් සම්බන්ද නඩු (ලකුණු 2x2 =04 යි)

(iii).

- නීත්‍යානුකූල රාජ උරුමයක් නොවීම
- උඩරට රාජධානිය පෘතුගීසි ග්‍රහණයෙන් බේරාගත යුතු වීම
- උඩරට රාජ්‍යය සිතාවක බලපෑමෙන් මුදාගතයුතු වීම
- පරිහානියට පත් බුදුසසුන නගා සිටුවිය යුතු වීම
- මහනුවර රාජධානියේ ආර්ථික කටයුතු දියුණු කළ යුතු වීම (ලකුණු 2+3 =05) යි)

(iv).

**1. මහවාසල හෙවත් මාලිගාව සතු නිලධාරීන් (මධ්‍ය පාලනය)**

- රජුගේ අධීක්ෂණය යටතේ මහවාසල හෙවත් රජ මාලිගාව තුළ නිලධාරින් රාශියක් කටයුතු කිරීම
- ගජනායක නිලමේ,මහ ලේකම්,මහ ගබඩා නිලමේ,දියවඩන නිලමේ,හළු වඩන නිළමේ,බත් වඩන නිළමේ,අස්පන්තියේ මුහන්දිරම්,කවිකාර මඩුව මුහන්දිරම්

**2. රටවසම හෙවත් ප්‍රදේශ පාලනය**

<u>රට ( අගනගරයට ආසන්න ප්‍රදේශ)</u>

උඩරට රාජ්‍ය **රට හා දිසාව** යනුවෙන් ප්‍රදේශ 21කින් සමන්විත විය.

- රට නම් ප්‍රදේශ භාර නිළධාරීන් **රටේ මහත්තයා** හෙවත් **රටේ රාළ** ලෙස හැදින්වීම
- ඔවුන් යටතේ ලියන රාළ උණ්ඩිය රාළ ආදී නිලධාරින් කටයුතු කිරීම

<u>දිසාවනිය ( අග නගරයට ඈතින් පිහිටි ප්‍රදේශ)</u>

- දිසාවනියක් භාරව සිටි නිලධාරින් දිසාව ලෙස හැදින් වූ අතර ,දිසාව නැවත කෝරළ පත්තු ආදී ලෙස බෙදීම
- කෝරලයක් භාරව සිටි නිධාරීන් කෝරළේ ලෙස හැඳින්වීම
- ගම් භාරව විදානේවරු පත් කිරීම

**3. බද්දෙ සංවිධානය**

- දිසාව තුළ සිටි ශිල්පින් හෝ කුල ඔවුන්ගේ කාර්යයන් අනුව වෙන වෙනම සංවිධානය කොට තිබුණි
- ඒවා එක් එක් අංශය සම්බන්ධ වූ කාර්යාංශ(දෙපාර්තමේන්තු) ලෙස හැඳින්වීය.

මඩිගේ බද්ද - ප්‍රවාහන කටයුතු හා සම්බන්ද කාර්යාංශය
කුරුවෙ බද්ද - අලි ඇතුන් ඇල්ලීම සම්බන්ද කාර්යාශය
බඩහැල බද්ද - වළං තැනීම සම්බන්ද කාර්යාංශය
රදා බද්ද - රෙදි සේදීම සම්බන්ද කාර්යාංශය
හැඳ බද්ද - රෙදි විවීම සම්බන්ද කාර්යාංශය

**4. විහාර - දේවාල පාලන කටයුතු**

- විහාරාරාම පාලනය මහනායක හා අනුනනායක හිමිවරුන්ගේ මූලිකත්වයෙන් ක්‍රියාත්මක විම
- දළදා මාලිගාවේ කටයුතු දියවඩන නිළමෙතුමා මගින් ක්‍රියාත්මක කිරීම

# ප්‍රශ්න අංකය 06

6.(i) මදුරාසි පාලනය යටතේ ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනයට පත් කළ නිලධාරීන් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03 යි)
(ii) බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාව කෙරෙහි අවධානය යොමු කිරීමට බලපෑ හේතු **දෙකක්** නම් කරන්න. (ලකුණු 04 යි)
(iii) ක්‍රි.ව 1797/98 කාල වකවානුවේ දී ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශයේ ඇති වූ බ්‍රිතාන්‍ය විරෝධී අරගලයට විසඳුම් සෙවීමට පත් කළ මියුරන් කොමිසමේ නිර්දේශ දෙකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)
(iv) ක්‍රි.ව.1848 දෙවන නිදහස් සටන අසාර්ථක වීමට බලපෑ හේතු **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

06. ( i ). රෙසිඩන්ට්,කලෙක්ටර්ස්,අවුම්ල්දාර් (ලකුණු 1x3 =03 යි)

( ii ).

- පිහිටීමේ වැදගත්කම
- වෙළෙඳ කටයුතුවල දී ඇති වැදගත්කම (ලකුණු 2 x 2 =04 යි)

(iii).

- පොල්ගස් බද්ද ඇතුළු අලුතෙන් පනවන ලද බදුවර්ග ඉවත් කිරීම.
  (පොල්ගස් බද්ද ,රා බද්ද,ලුණු බද්ද,මාළු බද්ද,දුම්කොල බද්ද)
- බදු එකතු කිරීම සඳහා යොදන ලද අවුම්ල්දාර් නැමැති නිළධාරීන් ඉවත් කොට දේශීය නිළධාරීන් පත්කර ගැනීම.
- ආදායම් එකතු කිරීම හා අධිකරණ කටයුතු සඳහා වෙන වෙනම නිළධාරින් පත් කිරීම
- ලන්දේසි උසාවි ක්‍රමය නැවත පිහිටුවීම (ලකුණු 2+3 =05) යි)

(iV).

**1. සටන දරුණු ලෙස මර්දනය කිරීම හා නායකයන් අත්තඩංගුවට ගැනීම**

- මෙම අවධියේ ලංකාවේ සිටි ආණ්ඩුකාර වූ ටොරිංටන් යුද්ධ නීතිය ප්‍රකාශයට පත්කොට කැරලිකරුවන්ට වෙඩිතබා මරා දමන ලෙස නියෝග කළේය. මේ සඳහා අමානුෂික යුද්ධ නිළධාරියෙක් වූ කපිතාන් වොට්සන් යටතේ ඉන්දියාවෙන් හමුදාවක් ගෙන්වා ගත් අතර අතිරේක යුද්ධ හමුදාවක් සමග විශාල බලඇණියක් මාතලේට පිටත් කර යැවීය

- **යුද්ධ නීතිය(මාර්ෂල් ලෝ)** පනවා දින හතරක් ඇතුළත . විශාල විනාශයක් සිදු කරමින් කැරැල්ල මර්දනය කිරීමට හැකිවිය.
- කැරලි නායකයන් වූ **පුරන් අප්පු,ගොන්ගාලේගොඩ බංඩා,ඩිංගිරාල ආදීන් අත්අඩංගුවට ගැනීම**
- ඉංග්‍රීසීන්ගේ අවි ආයුධ බලයට එරෙහිව සටන් කිරීමට සිංහල හමුදාවන්ට නොහැකි වීම. හා සිංහලයන් සතුව දියුණු යුද්ධ උපකරණ හෝ යුධ පුහුණුවක් නොතිබීම
- මෙම සටන උඩරට ප්‍රදේශ කිහිපයකට පමණක් සීමා වී පැවැති නිසා ඉංග්‍රිසි හමුදාවල සම්පූර්ණ බලය එම ප්‍රදේශවලට යොදවා පහසුවෙන් සටන මර්දනය කළ හැකි වීම.
- 1848 වනවිට මාර්ග පද්ධති ඉදිවී පැවති හෙයින් ඉතා ඉක්මනින් හා පහසුවෙන් යුධ භටයන් හා යුධ අවි ප්‍රවාහනය කළ හැකි වීම. (ලකුණු 3+3 =06 යි)

## ප්‍රශ්න අංකය 07

7. (i) කෝල්බෲක් ආණ්ඩුක්‍රමයෙන් අනතුරුව නව ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයක් ඉල්ලා යටත් විජිත භාර ලේකම් වෙත පෙත්සම් ඉදිරිපත් කළ ශ්‍රී ලාංකික සංවිධාන **තුනක්** නම් කරන්න (ලකුණු 03 යි)

(ii) ක්‍රි.ව 1833 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන් හඳුන්වාදුන් විධායක සභාවට යෝජනා කළ නිලධාරීන් **හතර දෙනෙකු** නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) ඩොනමෝර් ආණ්ඩුක්‍රමයේ කැපී පෙනෙන ලක්ෂණ **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) ශ්‍රී ලංකාවේ පළමු ජනරජ ව්‍යවස්ථාවේ කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

07. ( i ). යාපන සංගමය
හලවත සංගමය
පහතරට වැවිලිකරුවන්ගෙ සංගමය (ලකුණු 1x3 =03 යි)

( ii ). යටත් විජිත ලේකම් ,භාණ්ඩාගාරික ,ගණකාධිකාරී,මිනුම්පති,කොළඹ රේගු අයකැමි (ලකුණු2 x 2 =04 යි)


( iii). <u>ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යෝජනා</u>

1.රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම
2.සර්වජන ඡන්ද බලය
3.විධායක කාරක සභා ක්‍රමය හා අමාත්‍ය මණ්ඩලය
4.ආණ්ඩුකාරවරයා හා රාජ්‍ය නිළධාරීන්

**1. රාජ්‍ය මන්ත්‍රණ සභාව**

1833 කෝල්බෲක් කැමරන් ප්‍රතිසංස්කරණවල සිට ක්‍රියාත්මක වූ විධායක හා ව්‍යවස්ථාදායක සභාවට තිබූ බලතල රාජ්‍ය මන්ත්‍රණ සභාව වෙත පවරනු ලැබීය.

**රාජ්‍ය මන්ත්‍රණ සභාව -මන්ත්‍රීන් 61**




- රාජ්‍ය මන්ත්‍රණ සභාවේ මුලසුන හොබවන ලද්දේ එහි සාමාජිකයන්ගේ කැමැත්තෙන් තෝරාපත් කරගත් කතානායකවරයා විසිනි.ඒ අනුව ලංකාවේ පළමු කතානායකවරයා වූයේ ඒ.එෆ්.මොලමුරේ මහතාය.

**2. සර්වජන ඡන්ද බලය**

- කෲව් මැකලම් ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණයෙන් හඳුන්වාදුන් සීමිත ඡන්ද බලය මගින් ඡන්දය භාවිත කිරීමට අවස්ථාව හිමි වුනේ, ඉතා සුළු පිරිසකටය.එය මෙරට සමස්ථ ඡන්ද දායකයන්ගෙන් 4% තරම් වී තිබීම. ඒ සඳහා **උගත්කම,වත්පොහෙසත්කම,ස්ත්‍රී පුරුෂ භාවය** සලකා බැලීය.
- මෙය අඩු ආදායම් ලබන ජනතාවගේ ගැටළු කෙරෙහි දේශපාලනඥයන්ගේ අවධානය අවම වී ඇති බව කොමිසමේ අදහස වීම.
- ඩොනමෝර් කොමිසම මගින් කිසිදු බේදයක් නොතකා වයස අවුරුදු 21 වැඩි සියලුම ශ්‍රී ලාංකීය පුරවැසියන්ට ඡන්ද බලය පිරිනැමීම.

**3. විධායක කාරකසභා ක්‍රමය හා අමාත්‍ය මණ්ඩලය**

- රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සාමාජිකයන් විධායක කාරක සභා 07 කට බෙදීම.
- සෑම කාරක සභාවකටම සභාපතිවරයෙක් (අමාත්‍යවරයෙක්) පත් කිරීම
- මෙම සභාපතිවරු හත් දෙනා අමාත්‍ය මණ්ඩලය ලෙස හැඳින්වීම
- මෙම කාරකසභා හරහා ලංකාවේ ගොවිජනපද ව්‍යාපාරය,නිදහස් අධ්‍යාපනය වැනි පොදු ජනතාවට වැදගත් යෝජනා රසක් ක්‍රියාත්මක කිරීමට ඇමති මණ්ඩලයට හැකියාව ලැබීම
- කෘෂිකර්ම කටයුතු පිළිබඳ විධායක කාරක සභාවේ සභාපති වරයා ලෙස ඩී.එස්.සේනානායක මහතා පත් වීම
- අධ්‍යාපන පිළිබඳ විධායක කාරක සභාවේ සභාපතිවරයා ලෙස සි.ඩබ්.ඩබ්.කන්නන්ගර මහතා පත්වීම
- රාජ්‍ය මන්ත්‍රණ සභාව වර්තමාන පාර්ලිමේන්තුවේ මූලාරම්භය ලෙස සැලකිය හැකිය.

<u>විධායක කාරක සභා හත</u>

1.ස්වදේශ කටයුතු පිළිබඳ කාරක සභාව
2.කෘෂිකර්ම හා ඉඩම් පිළිබඳ කාරක සභාව
3.පළාත් පාලනය පිළිබඳ කාරක සභාව
4.සෞඛ්‍ය පිළිබඳ කාරක සභාව
5.කම්කරු,කර්මාන්ත හා වාණිජ විධායක කාරක සභාව
6.අධ්‍යාපනය පිළිබඳ විධායක කාරක සභාව
7.ගමනාගමනය හා පොදු වැඩ පිළිබඳ කාරක සභාව

**<u>4. ආණ්ඩුකාරයා හා රාජ්‍ය නිලධාරීන්</u>**

- එවක ක්‍රියාත්මක වෙමින් පැවැති ආණ්ඩුක්‍රමය යටතේ ආණ්ඩුකාරයා වෙත පැවරුණ බලතල රැසක් තිබුණි.ඩොනමෝර් ආණ්ඩුක්‍රමය යටතේ එම බලතල විශාල ලෙස අඩු විය.
- කෙසේ වුවත් පාලන කටයුතු සම්බන්ධයෙන් වැදගත් අංශ රැසක් ආණ්ඩුකාරයා වෙත පැවරී තිබුණි. මෙම නිසා ඩොනමෝර් ආණ්ඩුක්‍රමය අර්ධ වගකීම් ලබාදුන් ආණ්ඩුක්‍රමයක් ලෙස උගතුන් දක්වයි.

(ලකුණු 2+3 =05යි)

( iv).

**1. ජනාධිපති තනතුර**

- සෝල්බරි ව්‍යවස්ථාව යටතේ පැවැති අග්‍රාණ්ඩුකාර තනතුර වෙනුවට නාමික ජනාධිපති තනතුරක් පත් කළේය.
- අග්‍රාණ්ඩුකාරයාට එතෙක් හිමිව තිබූ බලතල ජනාධිපති වෙත පවරනු ලැබීය.
- එවක ලංකාවේ සිටි අග්‍රාණ්ඩුකාරයා වූ **විලියම් ගොපල්ලව මහතා,** ලංකාවේ පළමු නාමික ජනාධිපති ලෙස පත් විය.

**2. ජාතික රාජ සභාව**

- සෝල්බරි ප්‍රතිසංස්කරණය යටතේ රටේ ව්‍යවස්ථාදායක කටයුතු සිදු කළේ, ද්වි මණ්ඩල පාර්ලිමේන්තුව මගිනි.
- ඒ වෙනුවට 1972 ව්‍යවස්ථාවෙන් ජාතික රාජ සභාව ඇති කරන ලදී. මෙය ඒක මණ්ඩල ව්‍යවස්ථාදායකයකි. -ශ්‍රී ලංකාවට නීති සම්පාදනය කිරීමේ පූර්ණ බලය ජාතික රාජ සභාවට හිමි විය.

**3. අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය**

- මෙම ව්‍යවස්ථාව යටතේ රටේ විධායක බලය ක්‍රියාත්මක කිරීම අමාත්‍ය මණ්ඩලය හෙවත් කැබිනට් මණ්ඩලය වෙත පැවරුණි.
- අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානියා අගමැතිවරයා විය.

**4. අධිකරණ පද්ධතිය**

- 1972 ආණ්ඩුකම ව්‍යවස්ථාව යටතේ යුක්තිය පසිඳලීම සඳහා අධිකරණ පද්ධතියක් ඇති කළේය.

ශ්‍රේෂ්ඨාධිකරණය
මහාධිකරණය
දිසා අධිකරණය
මහේස්ත්‍රාත් අධිකරණය
ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා අධිකරණය

- අධිකරණ සේවයේ ස්වාධීනත්වය ආරක්ෂාවන පරිදි කටයුතු කිරීම සඳහා **අධිකරණ සේවා උපදේශක මණ්ඩලය** හා **අධිකරණ සේවා විනය මණ්ඩලය** පිහිටුවා තිබුණි. **කම්කරු උසාවි** එම මණ්ඩලය මගින් ක්‍රියාත්මක විය.

**5. මූලික අයිතිවාසිකම්**

1972 ආණ්ඩුක්‍රම ව්‍යස්ථාවේ 18 වන වගන්තියේ මූලික මිනිස් අයිතිවාසිකම් පිළිබඳව දැක්වේ. රටේ පුරවැසියාගේ මූලික මිනිස් අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දක්වා තිබීම ඉතා වැදගත්ය.

- නිතිය පසිඳලීම,ක්‍රියාත්මක කිරීම හා නිතියේ රැකවරණය සර්ව සාධාරණ විය යුතුයි.
- නිතියට අනුකූලව මිස පුද්ගලයෙකුගේ ප්‍රාණයට ,නිදහසට හෝ සුරක්ෂිතභාවයට හානි නොකළ යුතුයි.
- සෑම පුරවැසියෙතුටම සිතීමේ නිදහසට,හෘද සාක්ෂියේ නිදහසට හා ආගමික විදහසට අයිතිය තිබේ.
- පුරවැසියන්ට සාමකාමීව රැස්වීමට හා අදහස් ප්‍රකාශ කිරීමට නිදහස තිබේ.

## ප්‍රශ්න අංකය 08

8. (i) බ්‍රිතාන්‍යයේ ගල් අඟුරු බහුලව ඇති ප්‍රදේශ **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) කාර්මික විප්ලවය අවධියේ බ්‍රිතාන්‍යයේ පේෂ කර්මාන්තය දියුණු වීමට බලපෑ හේතු දෙකක් නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) කාර්මික විප්ලවයේ බලපෑමෙන් ලෝක දේශපාලනයේ සිදු වූ වෙනස්කම් දෙකක් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) කාර්මික විප්ලවයේ බලපෑමෙන් ශ්‍රී ලංකාවේ සිදු වූ වෙනස්කම් තුනක් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

08.

( i ). ලැන්කැෂයර්
යෝක්ෂයර්
දකුණු වේල්ස් (ලකුණු 1x3 =03 යි)

( ii).
1. රෙදිපිළි සඳහා ඉල්ලුම වැඩිවීම
2. බ්‍රිතාන්‍යයේ හා බ්‍රිතාන්‍ය යටත්විජිතවල ජනගහනය වැඩි වීම
3. පුනරුදයෙන් ලද දැනුම යොදාගනිමින් පේෂකර්මාන්තය දියුණුවට අවශ්‍ය යන්ත්‍රසූත්‍ර නිෂ්පාදනය කිරීම
(ලකුණු 2 x 2 =04 යි)

( iii).
**1. පන්ති සහිත සමාජයක් බිහිවීම**
- කාර්මික විප්ලවය නිසා උපරිම ලාභ ලැබීම අරමුණු කොටගෙන මුදල් ආයෝජනය කළ ධනපති පන්තියක් හා ශ්‍රමය විකුණා ජීවත්වන නිර්ධන පන්තියක් බිහි විය.
- ධනපතියෝ නිර්ධන පන්තියේ ශ්‍රමය අඩු මිලට විකුණාගෙන සිය ව්‍යාපාරික කටයුතුවල යොදවා අධික ලාභ ලැබූහ. එහෙත් කම්කරුවන්ගේ ජීවන තත්ත්වය බෙහෙවින් පහත් තත්වයකට පත්ව තිබුණි.

**2. වෘත්තීය සංගම්,සේවක වැඩවර්ජන ආදිය ආරම්භ වීම**
- කර්මාන්තශාලාවල සේවය කළ කම්කරුවන්ට තිබූ අධික පීඩාකාරී බව නිසාම ඉන් මිදීම සඳහා, කර්මාන්තශාලා හිමියන් හා කම්කරුවන් විවිධාකාර ගැටුම්,සේවක වැඩවර්ජන ඇති විය.
- එමෙන්ම සිය වෘත්තීන්වල අයිතිවාසිකම් ලබා ගැනීම සඳහා වෘත්තීය සංගම් ආදිය ද බිහිවන්නට විය. මෙම තත්ත්වය ලිබරල්වාදය ,සමාජවාදය වැනි දේශපාලන දර්ශනවල ව්‍යාප්තියට ද හේතුවක් විය.

**3. රාජ්‍ය නිර්බාධවාදය,නව අධිරාජ්‍යවාදය වැනි සංකල්ප බිහිවීම**
**රාජ්‍ය නිර්බාධවාදය**
- ඇඩම්ස්මිත් නැමැත්තා ධනවාදය විග්‍රහ කරමින් රාජ්‍ය නිර්බාධවාදය නම් සංකල්පය ඉදිරිපත් කළේය.
- එනම් රටේ ආර්ථික කටයුතුවල දී පෞද්ගලික අංශයේ සහභාගීත්වය දිරිමත් කිරීම හා රජයේ මැදිහත්වීම අවම කිරීමයි.

**4. නව අධිරාජ්‍යවාදය ඇතිවීම**

- කාර්මීකරණය යුරෝපය පුරා පැතිරීමත් සමග අමුද්‍රව්‍ය අඩු මිලට ලබා ගැනීමත් නිමි ද්‍රව්‍ය අළෙවි කිරීමත් සඳහා අවශ්‍යතාව ප්‍රබල ලෙස ඉස්මතු විය.මේ නිසා යුරෝපා රටවලට තම යටත් විජිත පූර්ණ ලෙස දේශපාලනික ආධිපත්‍යයකට නතු කරගැනීමට අවශ්‍ය විය.
- මේ අනුව වර්ෂ 1850 ට .පසුව ඇති වූ මෙම තත්ත්වය නව අධිරාජ්‍යවාදය ලෙස හැඳින් වේ.
(ලකුණු 2+3 =05යි)

( iv).
**1. වතුවගාව සඳහා යන්ත්‍රසූත්‍ර බ්‍රිතාන්‍යයෙන් ගෙන්වීම**
-පෙඩ්රික් නෝර්ත් කෝපි කෙටීමේ මොලක් ආරම්භ කිරීම
-තේ වියළීමේ සිට වර්ග කිරීම, අපනයනය යන්ත්‍රසූත්‍ර මගින් සිදු වීම
-රබර් පිටරට යැවීමට සූදානම් කිරීමට යන්ත්‍රසූත්‍ර භාවිතය

**2. ප්‍රවාහන කටයුතුවල දියුණුවක් ඇතිවීම**
- වතු ආශ්‍රිත නිෂ්පාදන කොළඹ නගරයට රැගෙන ඒම සඳහාත් වතුකරයේ අවශ්‍යතා සැපයීමටත් ප්‍රවාහනය දියුණු කළ යුතු විය.මේ නිසා මහා මාර්ග හා දුම්රිය මාර්ග ඉදිවීම ආරම්භ විය.
  උදා -එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකරු -කොළඹ නුවර මහා මාර්ගය ඉදි කිරීම
  හෙන්රි වොඩ් ආණ්ඩුකරු -කොළඹ නුවර දුම්රිය මාර්ගය ඉදි කිරීම
- ජල මාර්ගවල ලී පාලම් වෙනුවට යකඩ භාවිතා කර පාලම් තැනවීම ආරම්භ විය. එමෙන්ම, මහා මාර්ග තැනීමේ මැකඩම් ක්‍රමය ලංකාවට හඳුන්වා දුනි.

3. **නව වෙළෙඳ මධ්‍යස්ථාන හා වෙළෙඳ නගර බිහිවීම**
මාර්ග හා ප්‍රවාහන කටයුතුවල වර්ධනයත් සමග වෙළෙඳ මධ්‍යස්ථානත් ඒවා මුල් කරගෙන නගරත් බිහි විය.ගම්පොල,බදුල්ල,මාතලේ,රත්නපුර මේ අවධියේදී ජනාකීර්ණ වූ කොළඹින් පිට නගර කිහිපයකි.

4. **සන්නිවේදන ක්ෂේත්‍රයේ දියුණුවක් ඇති වීම**
- මෙම යුගය වන විට ලංකාවේ පැවැති පණිවිඩ හුවමාරු ක්‍රමය වූයේ කෙනෙක් අත පණිවිඩයක් යැවීමෙනි.1815 වන විට කොළඹ,ත්‍රිකුණාමලය,ගාල්ල හා යාපනය කේන්ද්‍ර කනිමින් රාජකරී තැපැල් සේවයක් ආරම්භ කෙරිණි.
- ඉන් පසුව කොළඹ නුවර මාර්ගය තැනවීමෙන් පසුව ආසියාවේ පළමු වරට අශ්ව කරත්ත මගින් තැපැල් සේවයක් ආරම්භ කෙරිණි.
- 1873 දී ලංකාවේ පළමු තැපැල් මුද්දරය නිකුත් කෙරිණි. 1903 වන විට රටේ විවිධ ස්ථනවල තැපැල් කාර්යාල 340ක් පිහිටුවා තිබුණි.
- පණිවිඩ යැවීමේ තවත් ක්‍රමයක් වූ ටෙලිග්‍රාප් සේවය ද පසුව ආරම්භ කෙරිණි. (ලකුණු 3+3 =06 යි)

## ප්‍රශ්න අංකය 09

9. (i) ඇමරිකන් නිදහස් සටන අවධියේ බ්‍රිතාන්‍ය අගමැති ජෝර්ජ් ග්‍රෙන්විල් විසින් ආදායම වැඩි කර ගැනීම සඳහා පනවන ලද නව බදු පනත් **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත $A$ සිට $D$ දක්වා ප්‍රශ්නවලට පිළිතුරු වරහන තුළින් තෝරා ලියන්න.

A - ඇමරිකානු විප්ලව ඉතිහාසයේ ප්‍රථම මහද්වීපික සම්මේලනය පැවැත් වූ නගරය
B - ප්‍රංශයේ ප්‍රාදේශීය පාලනය විධිමත් කිරීම සඳහා ප්‍රංශ රජු විසින් පත් කරන ලද නිලධාරීන්
C - නීතියේ සාරය නම් කෘතියේ කතුවරයා
D - රුසියාවේ සාර් පාලනය බිඳ දමා බලයට පත් සටන්කාමී නායකයා (ලකුණු 04 යි)

( රූසෝ , පැරිස් , පිලඩෙල්පියා , නැපෝලියන් බොනපාට් , ඉන්ටෙන්ඩාන්ට් , ස්ටේට් ජනරල්, කෙරෙන්ස්කි )

(iii) ප්‍රංශ විප්ලවය ඇතිවීමට බලපෑ ආර්ථික හේතු **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)
(iv) රුසියන් විප්ලවයේ ප්‍රතිඵල **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

09. (i) සීනි පනත
මුදල් නෝට්ටු පනත
මුද්දර පනත (ලකුණු 1x3 =03 යි)

(ii) A - පිලඩෙල්පියා
B - ඉන්ටෙන්ඩාන්ට්
C - මොන්ටෙස්ක්‍යු
D - කෙරෙන්ස්කි (ලකුණු 1 x 4 =04 යි)

(iii)

ප්‍රංශ විප්ලව සමය වන විට ප්‍රංශ භාණ්ඩාගාරය සම්පූර්ණයෙන්ම බංකොලොත් වී තිබුණි. ඒ සඳහා බලපෑ ප්‍රධාන හේතු කිහිපයක් විය.

1. **රජුගේ සහ රජ පවුලේ සුඛෝපභෝගී ජීවිතය සඳහා වැය වූ අධික වියදම්**
- මාලිගා ගණනාවක් පිහිටුවා ගනිමින් අධික සුඛෝපභෝගී ජීවිතයක් ගත කිරීම
- වර්සෙල්ස් නම් මාලිගය අක්කර ගණනාවක් පුරා විහිදුණු විශාල මන්දිරයක් වීම
- එය ජලාශ,ජල උද්‍යාන,මල් උදාන හා අලංකාරයට යෙදූ විවිධ නිර්මාණ ආදියෙන් සමන්විත වීම

**2. අනවශ්‍ය යුධ වියදම්**

- ප්‍රංශය බ්‍රිතාන්‍ය සමග ඇතිකරගත් සත් අවුරුදු යුද්ධය සහ ඇමරිකන් නිදහස් සටනට සහාය දීම යන කරුණු නිසා, ප්‍රංශය ආර්ථික අතින් පරිහානියට පත් වීම

**3. අසාධාරණ බදු ක්‍රමය**

- ප්‍රංශයේ පැවැති අධික බදු නිසා,ජනතාව පීඩාවට පත්වීම විප්ලවයට බලපෑ ප්‍රධාන හේතුවකි.ප්‍රංශයේ සාමාන්‍ය ජනතාව සිය ආදායමෙන් 60%ක් පමණ බදු වශයෙන් ගෙවිය යුතු විය.ජනතාවට ගෙවීමට සිදු බදු වර්ග කිහිපයක් නම්,

**ටේල් ,ගැබෙල් ,කැපිටේෂන්** (ලකුණු 2+3 =05යි)

( iv ) **දේශපාලන**

**1. සමාජවාදී සමූහාණ්ඩුවක් ඇතිවීම**

- සාර් පාලනය බිඳ වැටීම රුසියන් විප්ලවයේ වැදගත් ම දේශපාලන සිදුවීමයි. ඒ වෙනුවට සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමය නම් ජනරජයක් බිහිවිය.
- මෙම රජයේ නායකයා. වී.අයි.ලෙනින් මහතාය. මෙම රජය ජර්මනිය සමග පැවැති දිගුකාලීන යුද්ධය අවසන් කොට රටට සාමය උදා කළේය. එය සොල්දාදුවන්ගේ බලාපොරොත්තුවක් විය. මෙතුමා විසින් සමාජවාදී දර්ශනය අනුව යමින් පුද්ගල අවශ්‍යතාවලට වඩා පොදු අවශ්‍යතාවලට මුල්තැන දීම
- සමාජ අසාධාරණකම් හා අසමානාතා නැති කිරීම යන සංකල්ප පදනම් කරගනිමින් ගොඩනැගූ පාලන ක්‍රමය තුළින් සෝවියට් රුසියාව ශක්තිමත් රාජ්‍යයක් බවට පත්කිරීමට අවශ්‍ය මූලික අඩිතාලම දැමීය.

**2. කම්කරුවන් හා ගොවියන්ගෙන් සමන්විත නව නිළධාරී මණ්ඩලයක් පත් කිරීම**

-සාර් පාලනය සම්පූර්ණයෙන්ම බිඳ දමා ඒ වෙනුවට කම්කරුවන්ගෙන් හා ගොවි නියෝජිතයන්ගෙන් සමන්විත අලුත් නිළධාරී පිරිසක් පත්කෙරුණි.
- රුසියාව හඳුන්වනු ලැබුවේ **'සෝවියට් සමාජවාදී සමූහාණ්ඩුවාදී සංගමය'** නමිනි. ඒ අනුව රුසියාව සමාජවාදී ආර්ථික දර්ශනය පිලිගත් රටක් බවට පත්විය.

**ආර්ථික -**

**3. පෞද්ගලික ඉඩම් අයිතිය අහෝසි කිරීම**

**4. විශාල සමූහ ගොවිපලවල් නිර්මාණය කිරීම**

- මෙම නව ආණ්ඩුව විසින් රටේ පැවැති පුද්ගලික ඉඩම් අයිතිය අහෝසිකරන ලදී .ඒ අනුව අසාධාරණ ලෙස අත්පත්කරගෙන සිටි රදලයන්ගේ හා ප්‍රභූවරුන්ගේ ඉඩම් රජයට අයත් විය.
- මෙම ඉඩම් සමූහ අයිතිය යටතේ ගොවි කණ්ඩායම්වලට ලබාදෙන ලදී.මෙය ගොවියන්ගේ ඉඩම් පිළිබඳ ප්‍රශ්නයට විසඳුම විය. ඒ අනුව ගොවියන් සමූහ අයිතිය යටතේ මහාපරිමාණ සමූහ ගොවිපලවල් ආරම්භ කළහ.
- මේවායේ නවීන තාක්ෂණය යොදාගනිමින් මහාපරිමාණ ලෙස වගාකිරීමේ ප්‍රතිඵලයක් ලෙස රටේ ආහාර ප්‍රශ්නය විසඳුණි. ඉන් සියලු ජනාවගේ ආහාර පිළිබඳ ප්‍රශ්නය නිමා විය.

**5. ගමනාගමනය කර්මාන්තශාලා,බැංකු ජනසතු කිරීම**

- කොමියුනිස්ට් පාලනය යටතේ රුසියාවේ සියලු කර්මාන්තශාලා ජනසතු කළ අතර එහි පාලනය කොමියුනිස්ට් පක්ෂයේ මග පෙන්වීම යටතේ කම්කරුවන්ගෙන් සමන්විත සෝවියට් මණ්ඩලවලට පැවරුණි.මීට අමතරව බැංකුලගමනාගමනය ආදියද ජනසතු කෙරුණි.
- මේ අනුව රටේ ප්‍රධාන ආදායම් මාර්ග රාජ්‍ය අංශය සතුව පවත්වාගනිමින් එහි ප්‍රතිලාභ ජනතාව අතරට ගලා යාමට සැලස්වීය. (ලකුණු 3+3 =06 යි